Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

බෙර සරඹ වාදනය හා බැඳි තොරතුරු

ආධුනිකයකු දේශීය බෙර වාදනය කිරීම සඳහා දෑත් හොඳින් හුරු කරගත යුතුවේ. ගැට බෙර වාදනයේ දී දකුණු බෙර ඇස මත අත පෙරළීම ඒ අනුව වම් බෙර ඇස මත අත හැසිරවීමත් කළ යුතුය. ඒ සඳහා සාම්ප්‍රදායිකව බෙර සරඹ/ බෙර හරඹ හෙවත් හස්ත සාදන අභ්‍යාස දොළසක් පවතින බව පිළිගැනේ .මේවා එක් එක් ගුරු කුල අනුව වෙනස්කම් වලින් යුක්තය .එහෙත් සෑම ගුරුකුලයක ම අභිප්‍රාය වී ඇත්තේ ආධුනිකයෙකුට බෙර අක්ෂර නිවැරදි ආකාරයෙන් උත්පාදනය කිරීමට දෑත හුරු කරවීමයි. ආධුනිකයා ගුරුන් වෙත බාර දීමෙන් අනතුරුව ශිල්ප පුහුණු කිරීම සඳහා දීර්ඝ කාලයක් යොදා ගැනීම සාම්ප්‍රදායික සිරිතයි. බෙර හරඹ පද වාදනයේදී නියමිත ධ්වනි උපදවා ගැනීමේ හැකියාව මෙන්ම අදාල තාලය සහ විලම්භ/ මධ්‍ය /ද්‍රැත යන ලය පිළිබඳ අවබෝධය ද ලැබෙන පරිදි ඒවා පුහුණු කළ යුතුය.

බෙර වාදනයේ මූලික අභ්‍යාස

බෙරය වනාහී තාල පද නිපදවීමේ භාණ්ඩයකි.බෙර වැයීම ඉගෙන ගැනීමේදී පිළිගත් ශබ්දාක්ෂරමාලාවක් පුහුණු කොට ගත යුතුය. මෙය අලුත් භාෂාවක් උගන්නාක් මෙනි . බෙර වැයුමෙහි ස්වර වශයෙන් හැඳින්වෙන අක්ෂර සතරකි. . ඔවුන්ට උපකාර වන අක්ෂර සොළොසක් වෙයි .ස්වර අක්ෂර වලට බීජාක්ෂර යයිද උපකාර අක්ෂර වලට ගර්භාක්ෂර යැයි ද කියනු ලැබේ.ගර්භාක්ෂර හා බීජාක්ෂර සංයෝගයෙන් සරල පද නා නා පරිදි නිපදවා ගනු ලැබේ. එහි මනා පුරුද්දක් ඇති දක්ෂතම තාල වාදකයෝ රැසක් මෙකලද අපේ රටේ සිටිති.

බෙර වාදනය හා සබැඳි මූලික සරඹ වාදනය කිරීම

වාදනය පුහුණු කිරීමේදී තත්, , තොං, නං යන මූලික බීජාක්ෂර මත පදනම් වූ බෙර සරඹ පද ගොඩනැගී ඇත. තත් සහ තොං යන බීජාක්ෂර දෙක බෙරයේ වම් පසින් ද ජීත් නං යන බීජාක්ෂර බෙරයේ දකුණු පසින් ද වාදනය කරනු ලැබේ.

ගැටබෙරය වාදනයේදී ස්වර අක්ෂර හෙවත් බීජාක්ෂර යනු තත් ජිත් තොං නං යන සතර ය.

පහතරට බෙර වාදනයේ දී ස්වර අක්ෂර හෙවත් බීජාක්ෂර යනු තත් දිත් තොං නං යන සතරය

සබරගමු දවුල වාදනය වූයේ ස්වරාක්ෂර හෙවත් බීජාක්රෂ යනු තත් ජිත් තොං නං යන සතර ය.

| වාද්‍ය භාණ්ඩය | වාදනය වන ආකාරය |
|---|---|
| ගැට බෙරය | තත් - යන අක්ෂරයේ හඬ නිපදවීමේ දී බෙරයේ වම් ඇසට තදින් හඬ පුපුරා යන සේ වාදනය කල යුතුය.<br>ජිත් - යන අක්ෂරය වාදනයේදී දකුණු බෙර ඇසට තදින් හඬ පුපුරා යන ආකාරයට වාදනය කල යුතුය.<br>තොං -යන අක්ෂරය වාදනයේදී බෙරයේ වම් පස ගැටිය අසල ඇඟිලි තුඩුවලින් වාදනය කළ යුතුය.<br>නං -යන අක්ෂරය වාදනයේදී දකුණු පස බෙර ඇසේ ගැටිය අසලට සුළැඟිලි ප්‍රදේශයෙන් හඬ විහිදී යන සේ වාදනය කළ යුතුය. |
| පහතරට බෙරය | තත් - යන අක්ෂරය වාදනයේදි වම් අතේ මාපට ඇඟිල්ල හැර අනෙක් ඇඟිලි වදින සේ(වම)බෙරයේ හයි තට්ටුවට4වාදනය කළ යුතුය.<br>දිත් - යන අක්ෂරය වාදනයේදී සුරල් තට්ටුවේ ගැටිය අසලට දකුණු අතේ මාපට ඇඟිල්ල හැර අනෙන් ඇඟිලි හතරෙන් ධ්වනිය විහිදී යෑමට ඉඩ නොදි බෙර ඇස වසා තද කර වාදනය කළ යුතුය.<br>තොං - යන අක්ෂරය වාදනයේදී බෙරයේ වම් පැත්තේ ගැටිය අසලට මාපට ඇඟිල්ල හැර අනෙක් ඇඟිලි හතරෙන් හඬ විහිදී යන ලෙස වාදනය නළ යුතුය.<br>නං -යන අක්ෂරය වාදනයේදී සුරල් තට්ටුවේ ගැටිය අසලට මාපට ඇඟිල්ල හැර අනෙක් ඇඟිලි හතර වදින සේ වාදනය කළ යුතුය. |
| දවුල | තත්- යන අක්ෂරය වම් අතින් වම් ඇසට තදින් හඬ පුපුරා යන සේ) වාදනය තළ යුතුය(<br>ජිත් -යන අක්ෂරය දකුණු අතින් දකුණු බෙර ඇසට තදින් හඬ පුපුරා ) වාදනය තළ යුතුය (යන සේ<br>තොං -යන අක්ෂරය දකුණු අතේ ඇඟිලි වලින් වම් බෙර ඇසේ ගැටිය අසලට හඬ විහිදී යන ලෙසවාදනය කළ යුතුය<br>නං- යන අක්ෂරය දකුණු අතේ ඇඟිලිවලින් දකුණු ඇසේ ගැටිය අසලට හඬ විහිදී යන ලෙස වාදනය කළ යුතුය. |

## බෙර සරඹ

උඩරට සම්ප්‍රදාය-

1සරඹය-- තකට

සරඹය තකට කුදට 2

පහතරට සම්ප්‍රදාය -

1 සරඹය - ගුහිති ගහිති
2 සරඹය- ගුහිති ගදිරිකිට

සබරගමු සම්ප්‍රදාය -

සරඹය 1- තකට

සරඹය 2- තකට ජිකට

# බෙර වාදනයේ ශිල්ප ක්‍රම

බෙරයේ ධ්වනි නිෂ්පත්තිය යනු සම්මත ක්‍රමයකට අනුව බෙර දෙඇසෙහි හමට තැළීමෙන් විවිධ හඬ බිහි කිරීමයිදෙඅත්ල හා .ගැට බෙරයද පහතරට බෙරයද දවුලද දැතින් තැලීමෙන් හඬ උපදවා ගන්නා තූර්ය භාණ්ඩයය. මාණය ගැන විශේෂයෙන් සැළකිය ට යොදා ගන්නා බර ප්‍ර.ඇඟිලි ඒ සඳහා මුල් තැනක් ගන්නා නමුත් මෙහිදී දැ එහෙයින් බෙර වාදනයේදී .ඒ අනුව බෙරයේ හඬද වෙනස්කම් වලට භාජනය වේ .යුතුයඅත හැසිරවීමේ විවිධප්‍රම ඉතා වැදගත් වේඑම අවස්ථා වලදි .දවුල් වාදනයේදී අතින් හා කඩිප්පුව ආධාරයෙන් වාදනය කරන අවස්ථා ඇත. විශේෂයෙන් සුරල් ආදිය සහ ජෙං හඬ වැනි අවස්ථා වලදී .කඩිප්පුව මැනවින් භාවිත කිරීමට පුරුදු පුහුණු විය යුතුය කඩිප්පුව භාවිතා කිරීම සුවිශේෂී ලක්ෂණයකිඅත පෙරළීමෙන් උපදවන හඬ මෙන්ම අත බෙර ඇසට බර කිරීමෙන් . ඇතිල්ලීමෙන් ආදි විවිධ ශිල්පීය ප්‍රයෝග යොදමින් බෙර අක්ෂර ඉපදවිය හැකිය.

බෙර වාදනයේදී අවධානය යොමුකළ යුතු කරුණු

1. සාම්ප්‍රදායික බෙර වාදන ශිල්පීන් තමන් වාදනය කරන බෙරය දෙවියන් ගෙන් ලද දායාදයක් බව සැළකීම
2. එය පූජනීය වස්තුවක් සේ සලකා එයට ගෞරව කිරීම
3. බෙර වාදනයට යොමුවන ශිල්පියා බෙර වාදනය ආරම්භයේදී හා අවසානයේ බෙරයට වැඳ නමස්කාර කරන බව
4. වාදනයෙන් අනතුරුව බෙරය ආරක්ෂා සහිතව තැබිය යුතුබව
5. බෙරයෙන් උපදින අක්ෂර අවනද්ධාක්ෂර ලෙස හඳුන්වන බව

පැවරුම

1. බෙර සරඹ වාදනයේදී මුලින්ම.............වැයීමට පුරුදු විය යුතුය
   1මාත්‍රා 2 අක්ෂර 3 පද 4 කස්තිරම්
2. බීජාක්ෂර හා..............යනුවෙන් බෙර වාදනයේදී අක්ෂර ප්‍රභේද දෙකකි.
   1 ගර්භාක්ෂර 2 මාත්‍රාක්ෂර 3ගාත්‍රාක්ෂර 4ප්‍රාණාක්ෂර
3. බෙරයේ උපදින බීජාක්ෂර ගණන කීයද?
4. ගර්භාක්ෂර සතර නම් කරන්න
5. දෙවොල් බෙරයේ දකුණු ඇස හඳුන්වන තවත් නමක් ලියන්න